# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2416/11 - 2024 දෙසැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2024.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී ය.

**රෙගුලාසි**

01. මෙම රෙගුලාසි "**2024 අංක 15 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

02. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ 2024 දෙසැම්බර් මස 20 දිනැති අංක 24/2256/817/001-II දරන සංදේශය පිළිබඳ 2024 දෙසැම්බර් මස 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම රෙගුලාසි පනවනු ලබන අතර 2024 දෙසැම්බර් මස 04 දිනැති අංක 2413/37 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 4 රෙගුලාසිය, එහි "2024 දෙසැම්බර් 04 සිට 2024 දෙසැම්බර් 20 දක්වා කාලය තුළ" යන්න ඉවත් කර ඒ සඳහා "2024 දෙසැම්බර් 04 සිට 2025 ජනවාරි 10 දක්වා කාලය තුළ" යන්න ආදේශ කිරීමෙන් මෙමගින් සංශෝධනය කරනු ලැබේ

03. 2024 දෙසැම්බර් මස 04 දිනැති අංක 2413/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අනෙකුත් සියලුම විධිවිධාන එලෙසම බලපැවැත්වේ.

EOG 01-0032


1A - PG 6977 - 374 (2024/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*